**ඉන්දියානු කොන්සියුලර් ජනරාල් කාර්යාලය**

**හම්බන්තොට**

*******

**මාධ්‍ය නිකුතුව**

**2021 පෙබරවාරි 22**

**<u>හම්බන්තොට ඉන්දියානු කොන්සුල් ජනරාල් කාර්යාලයෙන් මැදවැලැන මහා විද්‍යාලයට සහ බෙරලිහෙල මහා විද්‍යාලයන්ට පොත් පරිත්‍යාගයක්</u>**

ඉන්දියානු කොන්සුල් ජනරාල් දිපින් පී.ආර් මහතා 2021 පෙබරවාරි 22 වන දින මැදවැලැන මහා විද්‍යාලයට සහ බෙරලිහෙල මහා විද්‍යාලයන් හි සංචාරයක නිරතවුයේය. කොන්සල් ජෙනරාල් විසින් පාසල් දෙකේහිම විදුහල්පතිවරුන් සමඟ ඵලදායි සාකච්ඡාවක නිරතවූ අතර පාසලේ සිසුන් සමඟ ද පිළිසඳරක යෙදුනේය. ඔහු ඒම අවස්ථාවේදී සිසුන්ගේ පුළුල් අධ්‍යාපනික සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය කියවීමේ ද්‍රව්‍ය හා වෙනත් යොමු පොත් කට්ටල කිහිපයක් පාසලට ප්‍රදානය කළේය.

02. හම්බන්තොට ඉන්දියානු කොන්සුල් ජනරාල් දීපින් පී.ආර් මහතා විසින් මැදවැලැන මහා විද්‍යාලයේ විදුහල්පති නාලන් ජයසේකර මහතා සහ බෙරලිහෙල මහා විද්‍යාවේ නියෝජ්‍ය විදුහල්පති ප්‍රියන්ත අලහකොන් මහතා වෙත පොත් කට්ටල පිළිගැන්වීය. හම්බන්තොට ඉන්දියානු කොන්සියුලර් ජනරාල් කාර්යාලය තම පාසලට ලබා දුන් දායකත්වය පිලිබඳ විදුහල්පතිවරුන්, ගුරුවරුන් සහ සිසුන් බෙහෙවින් අගය කළහ.

03. ඉන්දියානු කොන්සියුලර් ජනරාල් කාර්යාලය ආරම්භක අවධියේ සිට දකුණු පළාතේ පාසල් සමග විවිධ ක්‍රියාකාරකම් සංවිධානය කරයි. සංගීත භාණ්ඩ ප්‍රදානය, සිසුන් සඳහා ඉන්දියානු ශිෂ්‍යත්ව ලබාදීම , සංස්කෘතික වැඩසටහන් පැවැත්වීම, යෝගා වැඩසටහන් සහ වැඩමුළු වැනි විවිධ ක්‍රියාකාරකම් පැවැත්වීම ඉන් කිහිපයකි . ඊට අමතරව සෑම වසරකම ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවේ සිසුන්ට ඉන්දියාවේ අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව 794 ක් පිරිනමනු ලැබේ.

***